දෙපාර්තමේන්තු චක්‍රලේඛණ 2015/01(01)

මගේ අංකය: බ12/කොමු/මු.රේ 135,

මුදල් අංශය,

බන්ධනාගාර මූලස්ථානය,

කොළඹ 09.

2015.01.29

සියලුම කොමසාරිස්වරුන්/සියලුම අධ්‍යක්ෂකවරු /

නියෝජ්‍ය කොමසාරිස්වරුන්/සහකාර කොමසාරිස්වරුන්/

බන්ධනාගාර අධිකාරිවරුන්/

සහකාර අධිකාරිවරුන් සහ

සියලුම මාණ්ඩලික නිලධාරින් වෙත.

<u>**මුදල් රෙගුලාසි 135 නියමය යටතේ මුදල් පාලනය පිළිබඳ බලය පැවරීම 2015.**</u>

<u>**වැය ශිර්ෂ : 232 බන්ධනාගාර දෙපාර්තමේන්තුව.(සංශෝධන 1)**</u>

මුදල් රෙගුලාසි 135 නියමය යටතේ මුදල් පාලනය පිළිබඳ 2015 වසරේ බලය පැවරීම සමාංක 2015/01/01 දිනැති ලිපිය සමඟ බෙදා හරින ලද 2015/01 අංක දරණ දෙපාර්තමේන්තු චක්‍රලේඛණය මඟින් සිදු කර ඇත.

02). ඉහත චක්‍රලේඛණය මඟින් ඉංජිනේරු අධ්‍යක්ෂක වෙත පවරා ඇති පහත සඳහන් වැය ශීර්ෂයන්ගේ බලතල 2015/01/28 දින පැවති මාණ්ඩලික නිලධාරීන්ගේ රැස්වීමේදී අධ්‍යක්ෂක ඉංජිනේරුගේ ඉල්ලීම පරිදි එම බලතල අමුණා ඇති උපලේඛණ අනුව සිවිල් ඉංජිනේරු හා යාන්ත්‍රික ඉංජිනේරු වෙතද පැවරීම් කර බලය නැවත බෙදා හැර ඇත. සංශෝධිත වැය ශීර්ෂ පිළිබඳ විස්තර පහත දැක්වේ.

<u>**02.01** පුනරාවර්ථන වැය ශීර්ෂ (නඩත්තු වියදම්)</u>

232-01-01-0-1301 - වාහන නඩත්තු වියදම්

232-01-01-0-1302 - යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම්

232-01-01-0-1303 - ගොඩනැගිලි හා ඉදිකිරීම් නඩත්තු වියදම්

02.02 ප්‍රාග්ධන වියදම්

232-01-01-0-2001 - ගොඩනැගිලි පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම

232-01-01-0-2002 - යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ පුනරුත්ථාපන වැඩිදියුණු කිරීම

232-01-01-0-2003 - වාහන පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම.

232-01-01-0-2104 - ගොඩනැගිලි හා ඉදිකිරීම්

03). වාහන නඩත්තු පුනරාවර්ථන වියදම් (1301) වැය විෂය සඳහා වෙන් කර ඇති රුපියල් මිලියන 42 ක ප්‍රතිපාදන පාලනයේ වියදම් දැරීමේ බලතල පහත අනුව නිලධාරින් වෙත සීමා පැවරීම් කර ඇත.

| විස්තරය (බලතල පැවරීමේ සීමාව තුළ) | බලය ලබා දී ඇති නිලධාරි | වටිනාකම (සීමාව) රුපියල් |
|---|---|---|
| ටයර් ටියුබ් හා වෙනත් මිලදී ගැනීම් | බන්ධනාගාර කොමසාරිස් (සැපයුම්) | 16,000,000 |
| වාහන වාර සේවා කිරීම් සුළු අලුත්වැඩියාව, රක්ෂණ හා වෙනත් නඩත්තු වියදම් | ඉංජිනේරු අධ්‍යක්ෂක යාන්ත්‍රික ඉංජිනේරු | 24,000,000 |
| මූලස්ථානයේ වාහන සේවා කිරීම සුළු අලුත්වැඩියාව හා නඩත්තුව | ප්‍රවාහන අධිකාරි | 2,000,000 |

04). ප්‍රාග්ධන වියදම් දැරීමේදී මුදල් රෙගුලාසි 135 බලතල පැවරීම යටතේ ඒ අංශ විසින් සැලසුම් අංශයේ එකඟතාවය මත සකස් කරනු ලබන ක්‍රියාකාරි සැලසුම් වලට අනුව පමණක් කාර්යයන් අනුමත කළ යුතුය. ඒ ඒ අංශ විසින් අනුමත කරනු ලබන කාර්යයන් පිළබඳව මාසිකව සමාලෝචනය කර ක්‍රියාකාරි සැලසුම් වලට අනුව කටයුතු සිදු වන බවට අධ්‍යක්ෂක සැලසුම් විසින් පසු විපරම් කළ යුතුය. සියළුම අනුමත කරන ලද කාර්යයන් සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීම මූලස්ථානයේ ගිණුම් හා මූල්‍ය අංශයෙන් පමණක් සිදුවිය යුතු අතර එය ක්‍රියාකාරී හෝ සංශෝධිත සැලසුම් වලට අනුව පමණක් විය යුතුය. වාර්ෂික ක්‍රියාකාරී සැලසුම අනුව ඒ ඒ ප්‍රාග්ධන වැය විෂයේ තම පාලනයට යටත් ප්‍රතිපාදන සීමාවන් නොඉක්මවා කටයුතු කිරීමට අදාළ අංශ ප්‍රධානීන් වග බලා ගත යුතුය.

ඉහත උපදෙස් හා සංශෝධන වලට අනුව 2015 වර්ෂයේ අය වැය ඇස්තමේන්තු මඟින් වෙන් කර ඇති ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායි ලෙස භාවිතා කරමින් ප්‍රශස්ත ලෙස උපයෝජනය කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

චන්ද්‍රරත්න පල්ලේගම.

බන්ධනාගර කොමසාරිස් ජනරාල්

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.

පිටපත -

01. විගණකාධිපති

02. අභ්‍යන්තර විගණක (අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යාංශය)